බුද්ධශාසන අරමුදල - 2021

---------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බුද්ධශාසන අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | බෞද්ධ ධර්ම ග්‍රන්ථ | 6,539,327 | සමීක්ෂණ මණ්ඩල වාර්තා | 2022.12.31 දිනට ධර්ම ග්‍රන්ථ තොග සමීක්ෂණයන් සිදු කර ඇති අතර, ඒ අනුව සිදු කළ යුතු ගැලපීම් 2023 වර්ෂයේ ගිණුම් වලට ගැලපීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා සිටිමි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව නියමිත කාලවකවානු ඇතුළත භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කර වාර්තා ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය ගැලපීම් කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | සුනාමි ආධාර | 1,348,796 | ලැබීම් හා රඳවා ගැනීම් සම්බන්ධ විස්තරාත්මක තොරතුරු | සුනාමි ව්‍යසනයට පත් වෙරළාසන්න විහාරස්ථාන වලට ආධාර ලබා දීම සඳහා වෙන් කරන ලද මෙම පරිත්‍යාග මුදල ඉදිරියේදී පැවැත්වීමට නියමිත 89 වන පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු බුද්ධශාසන අරමුදල් ගිණුමට එකතු කිරීමට සැලසුම් කර ඇත. | විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | අත්තිකාරම් හා වෙනත් ලැබිය යුතු මුදල් | 13,031,828 | ශේෂ සනාථ කිරීම් හා වයස් විශ්ලේෂණ | එම ශේෂයන් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට නියමිතය. | ශේෂය සනාථ කළ හැකි තොරතුරු සහ වයස් විශ්ලේෂණ ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | ජංගම වගකීම් | 1,712,435 | ශේෂ සනාථ කිරීම් හා වයස් විශ්ලේෂණ | එම ශේෂයන් නිරවුල් කිරීමට හෝ සමුච්චිත අරමුදලට බැර කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට නියමිතය. | ශේෂය සනාථ කළ හැකි තොරතුරු සහ වයස් විශ්ලේෂණ ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | ගෙවීම් වවුචර | 3,427,140 | ගෙවීම් ලද බවට ලදුපත් | ඉදිරියේදී කරනු ලබන සියළුම ගෙවීම් සඳහා එම මුදල් ලද බවට ආදායකයාගෙන් ලදුපත් ලබා ගැනීමට අනිවාර්යෙන්ම කටයුතු කරන ලෙස අදාළ විෂය භාර නිලධාරීන් හට උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව, ගෙවීම් ලද බව සනාථ කළ හැකි පරිදි ආදායකයාගෙන් ලබා ගත් කුවිතාන්සි වවුචරයට අමුණා ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වයස් විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබූ රු.13,031,828 ක් වූ ලැබිය යුතු අත්තිකාරම් සහ වෙනත් ලැබිය යුතු මුදල් ශේෂයෙන් රු.1,087,447 ක් වර්ෂ 09 කට සහ රු.11,944,381 ක් වර්ෂ 06 කට වඩා පැරණි ශේෂයන් බව පසුගිය වර්ෂවල මූල්‍ය ප්‍රකාශන අනුව නිරීක්ෂණය වූ අතර අදාළ ශේෂයන් මෙම වාර්තාවේ දිනය වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම ශේෂයන් අයකර ගැනීමට උපදෙස් ලබා දී ඇත. | අදාළ ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වයස් විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබූ රු.1,712,435 ක් වූ ජංගම වගකීම් ශේෂයෙන් රු.544,409 ක් වසර 07 කට සහ රු.1,168,025 ක් වසර 06 කට වඩා පැරණි ශේෂයන් බව පසුගිය වර්ෂවල මූල්‍ය ප්‍රකාශන අනුව නිරීක්ෂණය වූ අතර එම ශේෂ නිරවුල් කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | එම ශේෂයන් නිරවුල් කිරීමට හෝ සමුච්චිත අරමුදලට බැර කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. | දීර්ඝ කාලයක සිට පැවතෙන අදාළ ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (අ) මුදල් රෙගුලාසි 371 (2) | යම් නිශ්චිත කාර්යයකට ලබා ගත් අතුරු අග්‍රිම අදාළ කාර්යය නිමවූ විගස පියවීමට කටයුතු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. අවස්ථා 03 කදී ගෙවා තිබූ එකතුව රු.90,000 ක් වූ අත්තිකාරම් මුදල් පියවීමට, දින 14 කට අධික කාලයක් ගත කර තිබූ අතර අත්තිකාරම් පියවන තෙක් ඉතිරි මුදල් අත | ඉදිරියේදී නියමිත කාල සීමාව තුළ අත්තිකාරම් පියවීමට කටයුතු කරන ලෙස අදාළ විෂය භාර නිලධාරියාට උපදෙස් ලබා දෙන ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | රඳවා ගෙන සිට ඇති බව ද නිරීක්ෂණය විය. | | |
| (ආ) | මුදල් රෙගුලාසි 757 | ගිණුම් වර්ෂය අවසානයේ භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව ඒ අනුව කටයුතු කර නොතිබුණි | 2023.08.31 දිනට භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර ඇති අතර, ඒ මගින් 2021.12.31 දිනට පැවති ස්ථාවර වත්කම් පවතින බව තහවුරු කර ගන්නා ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නියමිත දින වකවානු ඇතුළත වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කර වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**2. මෙහෙයුම් සමාලෝචනය**

**2.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදලෙන් දීමනා, ආධාර වැනි ගෙවීම් කිරීමේදී බොහෝ අවස්ථාවල අදාළ කාලසීමාව ඉකුත්වී මාස කිහිපයකට පසු ගෙවීම් සිදු කරනු ලබන බව නිරීක්ෂණය විය. ඒ අනුව, එකතුව රු.482,500 කට අදාළව මාස 01 සිට මාස 10 දක්වා ප්‍රමාදවීම් නිරීක්ෂණය විය. | බුද්ධශාසන අරමුදල මගින් සාමණේර ආයතන වෙනුවෙන් ගෙවීම් කිරීමේදී කලින් මස කරනු ලැබූ ගෙවීමට අදාළ ලදුපත් ලැබුණු පසුව ඊළඟ මාසයේ ගෙවීම් සිදු කිරීම නිසා ලදුපත් නිසි පරිදි නොලැබීම හේතුවෙන් මෙවැනි ප්‍රමාදයන් සිදු වී ඇත. ඉදිරියේදී බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන් මගින් ලදුපත් කඩිනමින් ගෙන්වා ගැනීමට වැඩපිළිවෙලක් සකස් කර ඇත. | අදාළ කාලසීමාව තුළ ගෙවීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව අරමුදලට අයත් බෞද්ධ ධර්ම ග්‍රන්ථ තොගයේ වටිනාකම රු. 6,539,327ක් වුවද, ඊට අදාළව සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | 2022.12.31 දිනට ධර්ම ග්‍රන්ථ තොග සමීක්ෂණයන් සිදු කර ඇත. ඒ අනුව සිදු කළ යුතු ගැලපීම් 2023 වර්ෂයේ ගිණුම්වලට ගැලපීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | 2021.12.31 දිනට බෞද්ධ ධර්ම ග්‍රන්ථ තොගයේ වටිනාකම, භෞතික සමීක්ෂණයක් මගින් සනාථ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අරමුදල විසින් ඉදිරිපත් කර තිබූ සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාවෙහි, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශය, වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය, මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය සහ බුද්ධශාසන අරමුදලේ කාර්යසාධන දර්ශක යන මාතෘකාවලට අදාළ තොරතුරු යනාදිය ඇතුළත් කර නොතිබුණි. | පිළිතුර නොගැලපේ. | අදාළ සම්පූර්ණ තොරතුරු ඇතුළත් කර වාර්ෂික වාර්තාව ප්‍රසිද්ධ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2021 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව අරමුදලේ සමස්ත ආයෝජන මුදල වූ රු.693,906,565න් රු 94,660,000ක් එනම් සියයට 14කට ආසන්න මුදලක් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබූ අතර එම ආයෝජන වෙනුවෙන් ලැබූ පොලී ප්‍රතිශතය සියයට 8 කට වඩා අඩු අගයක් ගෙන තිබුණි. ඒ අනුව, අරමුදලට අදාළ ආයෝජන සම්බන්ධයෙන් ඵලදායී තීරණ ගෙන ඇති බව නිරීක්ෂණය නොවීය. | 2023.03.24 දින පැවති 88 වන පාලක මණ්ඩලය විසින් භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතු සඳහා ලැබෙන පොලී අනුපාතයන් සන්සන්දනය කර වාසිදායක ලෙස ආයෝජනය කිරීමට ලබා දී ඇති අනුමැතිය අනුව 2023.12.08 දින කල් පිරුණු භාණ්ඩාගාර බිල්පත් තුනක් මහජන බැංකුවේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇත. අනෙකුත් භාණ්ඩාගාර බිල්පත් ද සුදුසු ආකාරයට ආයෝජනය කිරීමට උපදෙස් ලබා දී ඇත. | අරමුදලට අදාළ ආයෝජන සම්බන්ධයෙන් වඩා වාසිදායක ඵලදායී තීරණ ගත යුතුය. |

## 2.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් වියදම් වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේදී රු.48,446,525ක් අරමුදලේ ආදායම් ලෙස ලැබී තිබුණ ද එයින් රු.21,766,115ක් එනම් සියයට 44ක් පමණක් අරමුදලේ අරමුණු වෙනුවෙන් වැය කර තිබුණි. බුද්ධශාසනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම අරභයා ඉතාමත් යෝග්‍ය කාර්යයන් සඳහා මුදල් යෙදවීම අරමුදලේ කාර්යභාරය වුවද, වාර්ෂිකව අරමුදලට ලැබෙන ආදායමට සරිලන අන්දමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | බුද්ධශාසන අරමුදල මඟින් ක්‍රියාත්මක කළ හැකි නව ව්‍යාපෘති හඳුනාගනිමින් ඉදිරි වසර සඳහා පාලක මණ්ඩල අනුමැතිය සහිතව එම නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව දන්වා සිටිමි. | අරමුදලට ලැබෙන ආදායමට සරිලන ආකාරයට අරමුදලේ අරමුණු ඉටු කර ගැනීමට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 3.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් ප්‍රකාශිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 877 (2) (ඈ) අනුව, ගිණුම් වර්ෂය අවසන් වී මාස 2ක් ඇතුළත අරමුදල පිළිබඳ සහතික කළ මූල්‍ය ප්‍රකාශන ද සමඟ කාර්යසාධන වාර්තාව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත යොමු කළ යුතු වුවත් 2021 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන සහ කාර්යසාධන වාර්තාව වර්ෂයකුත් මාස 9ක ප්‍රමාදයකින් පසු 2023 නොවැම්බර් 30 දින විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණි. | 2022 වර්ෂයේ ගිණුම් වාර්තා ද පිළියෙල කර ඇති අතර, එම ගිණුම් වාර්තා 2021 වර්ෂයේ විගණනය අවසන් වීමෙන් පසුව විගණනය වෙත භාර දීමට හැකියාව ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන් වී මාස 2ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් ප්‍රකාශිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 877 (2) (ඉ) අනුව, අරමුදලේ මූල්‍ය වාර්තා, කාර්යසාධන වාර්තා සහ විගණන වාර්තා ඇතුළත් කරමින් වාර්ෂික කාර්යසාධන වාර්තාව නියමිත විධිවිධාන යටතේ භාෂාත්‍රයෙන්ම සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා මුදල් වර්ෂය අවසන් වී දින 150ක් ගත වීමට පෙර ඉදිරිපත් කළ යුතු වුවත් 2020 වර්ෂයට අදාළ වාර්ෂික කාර්යසාධන වාර්තාව, මෙම වාර්තාවේ දිනය වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව, මුදල් වර්ෂය අවසන් වී දින 150ක් ගත වීමට පෙර වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තිය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 (ආ) සහ 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 03 ඡේදය අනුව, අරමුදලට අදාළව අභ්‍යන්තර විගණනයක් සමාලෝචිත වර්ෂයේදී සිදු කර නොතිබුණි. | 2021 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන විමසුම ලැබී නොමැත. | අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුය. |

**3.4 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 877 (1) (ඇ) අනුව ඉදිරි වර්ෂයේ අයවැය ලේඛනය භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම සඳහා පවත්නා වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට පෙර ඉදිරිපත් කළ යුතු වුවත් 2021 මුදල් වර්ෂයට අදාළ අයවැය ලේඛනය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 2024 වර්ෂයේ සිට බුද්ධශාසන අරමුදලේ අයවැය ලේඛන සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. | අයවැයගත වියදම් දැරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |